**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ( අතිරේක මූල්‍යකරණය) ව්‍යාපෘතිය - 2018**

**------------------------------------------------------------------------------------------**

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ( අතිරේක මූල්‍ය කරණය) ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5768 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමෙහි 1 කොටසේ සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රධාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසිවල 4: 09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, වර්තමානයේ කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඌව පළාත්බද මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ දේශගුණික අවදානම කෙරෙහි නිරාවර්තිත ජනයා හා වත්කම් ගොදුරුවීම් සඳහා නතු වීමට ඇති ඉඩ අවකාශ අවම කිරීම හා ආපදාවන්ට සඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා වූ ධාරිතාවය වැඩි දියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,048 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 42 ක් වන අතර මුළු ණය ප්‍රමාණයම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 15 දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි 30 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යයසාධනය

### 2.1 ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව අතිරේක මූල්‍යකරණ අරමුණු සඳහා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ආර්ථිකයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර දේශගුණික අවබලපෑම් අවමකිරීමට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඊට අදාල උපකාරක සේවාවන් වැඩිදියුණු කිරීම්

ලෙස ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රධාන සංරචක 2 කින් සමන්විත වී තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **බලපෑම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිරීක්ෂණ** |
|---|---|---|---|---|
| (අ) | ලබා දී ඇති තොරතුරු වලට අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2018 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් පැකේජ් 68 ක් ප්‍රදානය කර තිබූ අතර එයින් කොන්ත්‍රාත් පැකේජ් 28 ක් 2018 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කාර්ය සාධන වාර්තාවට අනුව කොන්ත්‍රාත් පැකේජ් 17 යටතේ සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉතිරි කොන්ත්‍රාත් පැකේජ් 11 භෞතික ප්‍රගතිය සියයට 20 සිට සියයට 80 ත් අතර පරාසයක විය. | ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීම. | අදහස් දක්වා නැත. | අනාගත ව්‍යාපෘතීන් වලදී ප්‍රමාදයන් සිදුවීම වලක්වා ගැනීමට හැකිවන ලෙස මෙම ප්‍රමාදයන් පිළිබඳ අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම. |
| (ආ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ් 17 න් කොන්ත්‍රාත් පැකේජ් 15 ක් 2018 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිතව තිබුණු බව නිරීක්ෂණය විය. එයින් සමාලෝචිත වර්ෂය අවසානයේදී කොන්ත්‍රාත් පැකේජ් 6 ක භෞතික ප්‍රගතිය සියයට 10 ත් සියයට 80 ත් අතර පරාසයක් ලෙස වාර්තා වී තිබුණි. | -එම- | අදහස් දක්වා නැත. | -එම- |
| (ඇ) | ඌව පලාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් කැකේජ් 17 ක් ප්‍රදානය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් කොන්ත්‍රාත් පැකේජ් 4 ක | -එම- | අදහස් දක්වා නැත. | -එම- |

භෞතික ප්‍රගතිය සියයට 55 සිට සියයට 87 ත් අතර පරාසයක පැවතුණි.

## 2.2 වැඩබිම් පරික්ෂාවේදී නිරීක්ෂණය වූ කරුනු

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) මුරුතවෙල වැඩබිමෙහි 2019 ජුනි මාසයේ පරික්ෂාවේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය විසින් ලබා ඇති බොරළු කැණීම් හා ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර වැඩබිම තුල නොවුණි. | කැණීම් කටයුතු නීති විරෝධි ලෙස සිදුකල හැකි අතර කැණීම් කරන ලද ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කළ හැකිය. | සුදුසු ද්‍රව්‍ය සැපයීම හා පවත්නා රෙගුලාසි නියාමනය කිරීම කොන්ත්‍රාත් කරුගේ වගකීම වේ. | රෙගුලාසි පිළිපැදීමට කොන්ත්‍රාත්කරුවන්ට උපදෙස් ලබාදිය යුතුය. |
| (ආ) ව්‍යාපෘතිය මඟින් රසායනාගාර වාර්තා ලබා නොගෙන රිදියාගම වැඩබිමේ පස් කියුබ් 386 ක් සැපයීම හා සම්පිණ්ඩනය කිරීම සඳහා ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන 1.09 ක් වැයකර තිබුණි. ලබා දී ඇති තොරතුරු අනුව රිදියාගම කෘෂිකාර්මික ඇල මාර්ග නැවත ඉදිකිරීම සඳහා බොරලු කියුබ් 7,562 ක් සඳහා ගෙවීමට නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත් බොරලු කියුබ් 911 ක් ප්‍රවාහනය කිරීමේ බලපත්‍ර පමණක් විගණනයට ලබා දී තිබුණු අතර ඒ හේතුවෙන් සැපයූ බොරලු ප්‍රමාණය කොපමණක්ද යන්න විගණනයේදී තීරණය කල නොහැකි විය. | (i) තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලිය නිසිලෙස සකස්කර නොතිබීම.<br>(ii) වංචනික ලෙස ගෙවීම් කිරීමට හැකියාව ලැබීම. | මිනුම් හා ගෙවීම් කොන්ත්‍රාත්වලට අනුව, කලවැඩ ප්‍රමාණය ප්‍රමිතිගත මිනුම්වලට අනුව මිනුම් කිරීමෙන් පසුව ගණනය කල යුතුය. තවද වැඩ සම්පූර්ණ කිරීමෙන් පසුව බොරලු සඳහා වූ සම්පිණ්ඩන පරීක්ෂා කරමින් පවතී. | තත්ත්ව සහතික කිරීම සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳව දැඩි පාලනයක් තිබිය යුතුය. |

## 2.3 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ඇමරිකානු ඩොලර් මිලියන 42 ක්වූ, රු. මිලියන 6,048 සමාන මුළු ප්‍රතිපාදනයෙන් සියයට 33.38 ප්‍රමාණයක් වන රුපියල් මිලියන 2,226 ක් හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 14.02 ක් පමණක් 2018 දෙසැම්බර් 31 දිනට, එනම් ව්‍යාපෘතිය පවත්වාගෙන මාස 27 ක කාලයක් ගතවන විට වැයකොට තිබුණි. | ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 66.62 ප්‍රමාණයක් වන රුපියල් මිලියන 3,786 හෙවත් ඇමරිකානු ඩොලර් මිලියන 27.98 ක ප්‍රතිපාදන ඉතිරි මාස 18 ක කාලය ඵලදායි ලෙස උපයෝජනය කිරීමේ හැකියාව අවම මට්ටමක පවතී. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග සහයෝගීව ව්‍යාපෘතියේ කාර්යන් කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කොට තිබුණි. | ව්‍යාපෘතියේ ඉතිරි ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කිරීමට අවශ්‍ය කාර්යන් ව්‍යාපෘතිය අනුගමනය කල යුතුය. |

## 2.4 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| අභ්‍යන්තර විගනණ නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කමිටුවක් විසිනි එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වරයෙකු සහ ගණකාධිකාරවරයෙකු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂක වරයෙකු, මාර්ග සංවර්ධන අධිකාරියේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ හා වාරිමාර්ග ජල සම්පත් සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන කමිටුවක් | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට අපොහොසත් වීම. | මෙම ව්‍යාපෘතිය අවසන් අදියරට පැමිණ ඇති බැවින් නව ව්‍යාපෘති සඳහා වන චක්‍රලේඛ උපදෙස් ව්‍යාපෘතිය විසින් අනුගමනය කරනු ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිලිබඳව ස්වාධීන විමර්ෂණයක් ව්‍යාපෘතිය විසින් සිදුකල යුතුය. |

ව්‍යාපෘති අධ්‍යක්ෂ වරයා විසින් පත්කොට තිබුණි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිලිබඳ ප්‍රමාණාත්මක සොයාගැනීම් හදුනා ගත හැකිවන පරිදි විස්තරාත්මක විමර්ශනයන් අදාල කමිටුව විසින් සිදුකොට නොමැති බව නිරීක්ෂණය විය.